# පාදඩ ආශ්වාදායක ව්‍යාපාරයකින් ඔබ්බට

## ආචාර්ය මයිකල් ප්‍රනාන්දු



මුලින්ම කිව යුත්තේ මේ ප්‍රශ්නයට මා දෙන පිළිතුර වන්නේ අද අප විසින් රැක ගනු ලැබිය යුතුව ඇත්තේ, වඩාත් නිවැරදිව කිවහොත් යළි ස්ථාපිත කොට ගත යුතුව ඇත්තේ ප්‍රජාතන්ත්‍රවාදය බවයි. විධායක ජනාධිපති ධුරය පමණක් නොව එය ද ඇතුළත් සමස්ත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවම සම්පූර්ණයෙන් අහෝසි කොට නව දේශපාලන සංස්කෘතියක් ස්ථාපිත කිරීම ද කළ යුතුව ඇත්තේය. එසේම ප්‍රජාතන්ත්‍රවාදය යළි පිහිටුවීම යනු අපගේ අවසාන අරමුණ නොව සාධාරණ සමාජයක් බිහි කොට ගැනීමේ ප්‍රථම මෙන්ම අත්‍යවශ්‍ය පියවර බව ද දැඩි ලෙස අවධාරණය කළ යුතුව තිබේ. විධායක ජනාධිපති ක්‍රමය ආරම්භ වීමත් සමග සාධාරණ සමාජයක් කරා යන ගමනට බාධාකාරී ලෙස මෙරට තුළ වර්ධනය වෙමින් පැවති සමාජ හා දේශපාලන ප්‍රවණතාවයන් එක්තරා උච්ඡස්ථානයකට පැමිණි බව සියලු ප්‍රගතිශීලි දේශපාලකයන්, දේශපාලන පක්ෂ හා දේශපාලන විද්‍යාඥයන් විසින් ද අවිවාදයෙන් පිළි ගනු ලැබ ඇති බැවින් ඒ පිළිබඳ දිගින් දිගට විස්තර කිරීම අනවශ්‍යය.

අද අප ඉදිරියේ ඇති ප්‍රධානතම අභියෝගය වන්නේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කොට ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීම යයි යන නිගමනය පිළිබඳ අදාළ වන කරුණු කීපයක් මෙසේ දක්වනු කැමැත්තෙමි.

ප්‍රථමයෙන්ම අද මෙරට සමස්ත සමාජ දේහය වසා ව්‍යාප්තව ඇති දූෂණයේ, නීතියේ පාලනයේ බිඳ වැටීමේ ප්‍රධාන සාධකය වන්නේ එක් පුද්ගලයෙකු හෝ පුද්ගලයන් අතළොස්සක් වෙත බලය පවරන විධායක ජනාධිපති ක්‍රමයයි ඔබ වැඩි දෙනෙකු මෙන් මම ද සිතමි. එය අද ජාතිවාදය හා

> *විධායක ජනාධිපති ධුරය පමණක් නොව එය ද ඇතුළත් සමස්ත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවම සම්පූර්ණයෙන් අහෝසි කොට නව දේශපාලන සංස්කෘතියක් ස්ථාපිත කිරීම ද කළ යුතුව ඇත්තේය. සත්‍යය නම් මේ පවතින ආකාරයේ විධායක බලතල අවශ්‍ය වන්නේ නීතියේ පාලනයක් නොමැති මැර පාලනයක් පවත්වා ගැනීමටය*

ආගම්වාදය හා අත්වැල් බැඳ ගත් ෆැසිස්ට් ස්වරූපයේ අධිකාරීවාදී, මිලිටරිවාදී පාලනයන් කරා රට ගෙන යමින් පවතී. එබැවින් එබඳු අනර්ථකාරී ගමනක් අත්හිටුවා රට නව මගකට යොමු කිරීම ආරම්භ කිරීමේ පූර්ව අවශ්‍යතාවය වි ඇත්තේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමයි. කිසිදු වාමාංශිකයෙකුට, ප්‍රගතිශීලියෙකුට හෝ නිදහස් මතධාරියෙකුට විධායක ජනාධිපති ක්‍රමයේ පැවැත්මට අනුබල දෙන පියවරක් ගැනීමේ සදාචාරාත්මක අයිතියක් තිබිය නොහැකිය.

දෙවනුව, විධායක ජනාධිපති ධුරයට හා ක්‍රමයට විරුද්ධ වන කිසිවකුටත් වර්තමාන විධායක ජනාධිපතිවරයා තෙවන වරටත් විධායක ජනාධිපති ධුරය සඳහා අපේක්ෂකයෙකු ලෙස ඉදිරිපත් වුවහොත් කළ යුත්තේ කුමක්දැයි යන්න පිළිබඳව සැකයක් හෝ අවිනිශ්චිතභාවයක් තිබිය නොහැකියයි මම සිතමි.

තුන් වෙනුව, එක් අතකින් අද පවතින ගජමිතුරු ධනවාදය විසින් මෙහෙයවනු ලබන අර්ථ ක්‍රමය තුළින් කිසිසේත් අධිරාජ්‍ය විරෝධයක් අපේක්ෂා කළ නොහැකියයි මම සිතමි. එය නව ලිබරල්වාදය හෝ නව ලිබරල්වාදයටත් වඩා විකෘත වූ පාදඩ ආශ්වාදායක ව්‍යාපාරයකි. අධිරාජ්‍යවාදයේ සහාය නොමැතිව එයට පැවතිය නොහැකිය. එබැවින් මෙම විධායක ජනාධිපති ක්‍රමයට සහාය දීමෙන් අධිරාජ්‍යවාදයෙන් රට මුදාගත හැකියයි සිතීම ආත්ම වංචාවකි. එමෙන්ම ව්‍යාජ අවස්ථාවාදී තර්කයකි.

සිව් වෙනුව, විධායක බලතල සහිත ජනාධිපති ධුරයේ බලය යුද්ධය ජය ගැනීමට උපකාරීවීයයි හෝ රටේ ස්ථාවරත්වය රැක ගැනීමට එම බලතල අවශ්‍යය යන තර්කය ද එසේම පදනම් විරහිතය. සත්‍යය නම් මේ පවතින ආකාරයේ විධායක බලතල අවශ්‍ය වන්නේ නීතියේ පාලනයක් නොමැති මැර පාලනයක් පවත්වා ගැනීමට බවය. ලෝකයේ සමාජ සාධාරණයක් ක්‍රියාතක්මක වන හැම රටකම එබඳු පරිසරයක් ඇති වීමට ප්‍රධාන සාධකය වී ඇත්තේ ප්‍රජාතන්ත්‍රවාදය විසින් බිහිකරනු ලැබ ඇති යහ පාලනයයි යනු මගේ ද විශ්වාසයයි.

ලෝකයේ අනාගතය රඳා පවතින්නේ සමාජ සාධාරණය මෙන්ම පරිසරයේ සුරක්ෂිතභාවය මතය යන්න වර්තමාන විද්‍යාඥයන්, සමාජ විද්‍යාඥයන් මෙන්ම ආගමික නායකයන් ඇතුළු සිවිල් සමාජ ක්‍රියාකාරීගේ පිළිගැනීම බවට පත් වෙමින් ඇති ආකාරය කෙරෙහි ඔබගේ අවධානය යොමු කිරීමට කැමැත්තෙමි. එබඳු පරිසරයක් ජනිත කළ හැක්කේ ප්‍රජාතන්ත්‍රවාදී පරිසරයක් තුළ පමණය යන්න පිළිබඳ සැකයක් නැති අතර අප රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය ගොඩ නැගීමේ ප්‍රධාන සාධකය විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමයි.

මෙහි දී ඇල්බර්ට් අයින්ස්ටයින් විසින් 1949 දී ලියන ලද සමාජවාදය කුමට ද යන රචනය, 1990 දී ෆ්‍රැන්සිස් ෆුකුයාමා ලියූ ඉතිහාසයේ අවසානය ග්‍රන්ථය, 2010 දී ඔහු විසින්ම ලියූ සමාජවාදයේ පුනරාගමනයක් සිදු වේ ද? යන රචනය හා පළමුවන ෆ්‍රැන්සිස් පාප්වරයා අධිරාජ්‍යවාදය ගැන කරන ප්‍රකාශන, ඉන්දියාවේ අමර්ත්‍යා සෙන්, අමෙරිකා එක්සත් ජනපදයේ ජෝසප් ස්ටිග්ලිට්ස් මෙන්ම ප්‍රංශයේ තෝමස් පිකෙටි වැනි වර්තමාන ආර්ථික විද්‍යාඥයන්ගේ අදහස් මෙන්ම වර්තමාන ලෝකයේ විද්‍යාඥයන් පිරිසක් විසින් ප්‍රචලිත කරනු ලැබ ඇති එකම සෞඛ්‍යයක් හෙවත් ඩබැ ඤ්කළුය සංකල්පය ප්‍රජාතන්ත්‍රවාදය හා සමාජ සාධාරණයෙන් තොරව සමස්ත පෘථිවි තලයේම අනාගත පැවැත්මක් තිබිය හැකි ද යන ප්‍රශ්නය නගා ඇති ආකාරය ද අපගේ කුඩා රට මුහුණ දෙන ප්‍රශ්නය පුළුල් පසුතලයක් මත තබා නිරීක්ෂණය කිරීම සඳහා නව ආලෝකයක් සපයන්නේයයි සිතමි.



**සංවාද සටහන**

**ශ්‍රීලාල් සෙනෙවිරත්න**

පසුගිය 31 වන සිකුරාදා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව හෙවත් United Nations Human Rights Panal නමැති ආයතනය ලංකා රජය වෙත නිකුත් කොට ඇති පණිවිඩය තීරණාත්මක වැදගත්කමකින් යුක්ත ප්‍රකාශනයකි. එය ලංකා රජයට දන්වා ඇත්තේ රටේ ජනාධිපතිවරයාට අසීමිත බලතකතල පවරන 18 වන ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කරන ලෙසයි. අප රට සමහරුන්ගේ විවේචනයට ලක්ව ඇති එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමේ මාර්තු යොජනා වට වඩා මෙය ප්‍රබල බවත් තීරණාත්මක බවත් අප අමතක කළ යුතු නැත.




